# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,343 - 2023 ජූලි මස 28 වැනි සිකුරාදා - 2023.07.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1662 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1674 |


*සැ. යු.*- (i) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2023 ජූලි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ජ්‍යොෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත් කෙටුම්පත 2023 ජූලි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2023 ජූලි මස 14 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 අගෝස්තු මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අගෝස්තු මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1659 - B 82477 — 5,403 (2023/07)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

### මහා භාරකාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2023

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මහා භාරකාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබා දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම් :

(i) *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයෙකු වශයෙන් වසර 03 කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, දිනය හා නිලමුද්‍රාව පැහැදිලිව සඳහන්කර සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.);

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක* වසර තුන (03) කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම.

***සටහන.***-මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින් ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. සේවා කාලය ආරම්භවන හා අවසානවන දිනය පැහැදිලිව සඳහන් නැති සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

* නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරුය.

(iii) *කායික යෝග්‍යතාව :*
සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

(iv) *වෙනත් සුදුසුකම් :*

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට පත් වී වසර 03 ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම තනතුරට පත් වී වසර තුනක් ඉකුත් වීමට පෙර සේවයට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද, මෙම පත්වීම යටත් වේ.

(v) ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

04. වයස් සීමාව :
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. වැටුප් පරිමාණය :

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 = රු. 110,895 (SL-I-2016) වේ.

06. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ. :

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්**<br>(අ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | 25 |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 20 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද, | | |
| | ● පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | ● දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | ● පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | ● සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | (ඈ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 5 | |
| | *සටහන* - I. නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ.<br>*සටහන* - II. ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02 | **අතිරේක පළපුරුද්ද**<br>නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම් | | 35 |

| | නඩු ගොනු කිරීම් (එක් නඩුවක් සඳහා) | අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා) |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 2 | 5 |
| අභියාචනාධිකරණය | 2 | 4 |
| මහාධිකරණය | 2 | 3 |
| දිස්ත්‍රික් උසාවි | 4 | 5 |
| විනිශ්වයාධිකාර | 2 | 3 |

**සටහන**
* ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන්වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 03 | **භාෂා හැකියාව** | | 15 |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය | 15 | |
| | (ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරගවලදී (Moot Court Competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව | 12 | |
| | කේවල | | |
| | (i) ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව | 12 | |
| | (ii) දෙවන ස්ථානය | 10 | |
| | (iii) තෙවන ස්ථානය/වෙනත් කුසලතා | 08 | |
| | කණ්ඩායම් | | |
| | (i) ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාවය | 10 | |
| | (ii) දෙවන ස්ථානය | 08 | |
| | (iii) තෙවන ස්ථානය/වෙනත් කුසලතා | 06 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් | 10 | |
| | (ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම | 08 | |
| | (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් NVQ 4 මට්ටමේ සහතිකයක් | 05 | |
| | **සටහන** : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ. | | |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 04. | **තොරතුරු තාක්ෂණය/තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම**<br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම සඳහා | 10 | 10 |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක් | 08 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. | 05 | |
| | (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබාගත් සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.)<br>සටහන : ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 04 | |
| 05. | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>තනතුරෙහි භූමිකාව ඉටු කිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ<br>● ශක්තීන් (Strength questions)<br>● අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (Situational questions) හා<br>● දක්ෂතාව (Competency Questions)<br><br>ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබා දෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | <br><br>02<br>03<br>10 | 15 |
| | **එකතුව** | | 100 |

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකපත්‍රවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :

(i) අයදුම්පත් **2023.08.27** වැනි දිනට හෝ එදිනට ප්‍රථම ''මහා භාරකාර තැන, මහා භාරකාර දෙපාර්තමේන්තුව, අංක 2, බුලර්ස් පටුමග, කොළඹ 07'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 04 දක්වාත්, දෙවන පිටුව 05 සිට 07 දක්වාත් තෙවන පිටුව 08 සිට 09 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 47,615/- ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

09. **සාවද්‍ය තොරතුරු සැපයීම :**
ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් හෝ ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

2023 ජූලි මස 21 වැනි දින.

ආදර්ශ අයදුම් පත්‍රය

මහා භාරකාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2023

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුළ ලියන්න.) සිංහල -2/දෙමළ -3/ඉංග්‍රීසි -4

***සටහන.***-අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

1.0

(1) 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 මුලකුරු සමග නම (මයා/මිය/මෙය) :————.
(සිංහලෙන්/දෙමළෙන්)
උදා : එම්. ජී. බී. එස්. කේ. ගුණවර්ධන

1.4 මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(2.0) 2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(3.0) 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐
ස්ත්‍රී - 1

3.2 විවාහක/අවිවාහක බව : විවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐
අවිවාහක -2

3.3 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.4 2023.08.27 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 දුරකථන අංකය : ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐

ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

(5.0) 5.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබා ගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :

| *සුදුසුකම් ලබාගත් ආයතනය* | *ලබාගත් දිනය* |
|---|---|
| ........................................................... | .............................. |
| ........................................................... | .............................. |

* ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දුන් දිනය :————.

* මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික/ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය :————.

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර :

5.2 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :..........................................................................................
..........................................................................................................................

5.3 අතිරේක වෘත්තීය පළපුරුද්ද :..........................................................................................
..........................................................................................................................
..........................................................................................................................

5.4 තොරතුරු තාක්ෂණ පිළිබඳ දැනුම :..........................................................................................
..........................................................................................................................

5.5 භාෂා හැකියාව :..........................................................................................
..........................................................................................................................

* අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර, එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට සූදානම් කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

6.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ලකුණ (✓) යොදන්න) (ඔව් නම් විස්තර කරන්න.)

| නැත | |
|---|---|

| ඔව් | |
|---|---|

..........................................................................................................................................................

7.0 අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී .............. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සම්පූර්ණ නම :————.
තනතුර :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ඃ

ඉහත විස්තර සඳහන් ............................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)

07-372

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාර ව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ 2023 අගෝස්තු 11 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය)

**සැ.යු.** ඃ තමන් අයදුම් කරන තනතුර අයදුම්පත්‍රයෙ හි ඉහලින් සඳහන් කිරීම අනිවාර්යය වේ.

1. **අධ්‍යක්ෂ (සන්නිවේදන) තනතුර**

1.1 වැටුප් පරිමාණය-2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු.67,485 - 4 x 1,630 / 8 x 2,170 - රු. 91,365/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 142,000/- පමණ වේ).

1.2 වයස් සීමාව- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සහ පාර්ලිමේන්තු සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

1.3 අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ඃ

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරන ආයතනයකින් ලබා ගත් ජනසන්නිවේදනය හෝ අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය;

සහ

අලෙවිකරණය/මහජන සබඳතා/සන්නිවේදනය සහ මාධ්‍ය/ මානව සම්පත් කළමනාකරණය පිළිබඳව අවම වශයෙන් වසර පහක වෘත්තීමය පළපුරුද්ද

හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරන ආයතනයකින් ලබා ගත් ව්‍යාපාර කළමනාකරණය (අලෙවිකරණය)/ව්‍යාපාර පරිපාලනය /අලෙවි කළමනාකරණය (විශේෂ)/කලා (සන්නිවේදනය/ජන සන්නිවේදනය/මහජන සබඳතා / මාධ්‍ය කළමනාකරණය/සන්නිවේදනය සහ නිර්මාණාත්මක කලා)/ සත්කාරක සේවා සහ විනෝදාස්වාද කළමනාකරණ/ජනමාධ්‍යවේදය පිළිබඳ උපාධිය;

සහ

අලෙවිකරණය/මහජන සබඳතා/සන්නිවේදනය සහ මාධ්‍ය/ මානව සම්පත් කළමනාකරණය පිළිබඳව වසර දහයක වෘත්තීමය පළපුරුද්ද

හෝ

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී (පැරණි නිර්දේශය) එකවර විෂයයන් 04 සමත් වී තිබීම/ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (නව නිර්දේශය) එකවර විෂයයන් 03 සමත් වී තිබීම; සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යෙන් අදාළ සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක්, ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ඇතුලත්ව විෂයන් 06 කින් දෙවරකට වඩා නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම; සහ

අලෙවිකරණය/මහජන සබඳතා/සන්නිවේදනය සහ මාධ්‍ය/ මානව සම්පත් කළමනාකරණය පිළිබඳව වසර විස්සක වෘත්තීමය පළපුරුද්ද

1.4 බඳවා ගැනීමේ ක්‍රමය-ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

1.5 වෙනත් ප්‍රතිලාභ - රියදුරු සමඟ නිල වාහනයක්

2. **මාධ්‍ය කාර්යාල සම්බන්ධීකාරක (සිංහල)**
**මාධ්‍ය කාර්යාල සම්බන්ධීකාරක (දෙමළ)**
**මාධ්‍ය කාර්යාල සම්බන්ධීකාරක (ඉංග්‍රීසි)**

2.1 වැටුප් පරිමාණය-2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.32,330 - 3 x 380 / 10 x 445/4 x 660 -රු. 40,560/-වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.75,000/- පමණ වේ).

2.2 *වයස් සීමාව*- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 25ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතු ය.

2.3 අධ්‍යාපන සුදුසුකම් -
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (පැරණි නිර්දේශය) එකවර විෂයයන් 04 සමත් වී තිබීම/ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (නව නිර්දේශය) එකවර විෂයයන් 03 සමත් වී තිබීම;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය සඳහා

(සිංහල/දෙමළ/ඉංග්‍රීසි) සඳහා සම්මාන සාමාර්ථයක් සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ඇතුලත්ව විෂයන් 06 කින් දෙවරකට වඩා නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම

**සටහන :** අදාළ භාෂා මාධ්‍යය සිංහල/ දෙමළ නම් ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් අත්‍යවශ්‍ය වන අතර අදාළ භාෂා මාධ්‍යය ඉංග්‍රීසි නම් සිංහල/දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් අත්‍යවශ්‍ය වේ.

2.4 වෘත්තීය සුදුසුකම් :

රජය විසින් පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණය/ රූපවාහිනී පසු නිෂ්පාදන තාක්ෂණය/ පරිගණක ග්‍රැෆික් නිර්මාණකරණය/ ඡායාරූපකරණය/ වීඩියෝකරණය/ වීඩියෝ සංස්කරණය/ මාධ්‍ය/ පුවත්පත් කලාව පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබීම

2.5 පළපුරුද්ද :

*බාහිර* - ඉහත 2.4 හි දක්වා ඇති එක් විෂයයක / ක්ෂේත්‍රයක වසර තුනකට නොඅඩු පළපුරුද්ද

*අභ්‍යන්තර* - පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ වසර පහක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම

2.6 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**3. මහජන සේවා කාර්යාල සම්බන්ධීකාරක (ඉංග්‍රීසි)**

3.1 වැටුප් පරිමාණය-2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය

රු.32,330 - 3 x 380 / 10 x 445/4 x 660 - රු. 40,560/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.75,000/- පමණ වේ).

3.2 වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 25ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතු ය.

3.3 අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (පැරණි නිර්දේශය) එකවර විෂයන් 04 සමත් වී තිබීම/ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (නව නිර්දේශය) එකවර විෂයන් 03 සමත් වී තිබීම;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් සහ සිංහල/දෙමළ භාෂාව හා ගණිතය සඳහා සාමාන්‍ය සාමාර්ථ ඇතුලත්ව විෂයන් 06 කින් දෙවරකට වඩා නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

3.4 වෘත්තීය සුදුසුකම් :

රජය විසින් පිළිගත් ආයතනයකින් නිකුත් කරනු ලබන මහජන සම්බන්ධතා/ සන්නිවේදනය/ මානව සම්පත් කළමනාකරණය/ පරිගණක ග්‍රැෆික් නිර්මාණකරණය/ ඡායාරූපකරණය/ මාධ්‍යවේදය/ සංචාරක/ උත්සව කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

3.5 පළපුරුද්ද :

බාහිර - ඉහත 3.4 හි දක්වා ඇති එක් විෂයයක / ක්ෂේත්‍රයක වසර තුනකට නොඅඩු පළපුරුද්ද

අභ්‍යන්තර - පාර්ලිමේන්තු මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ වසර පහක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබීම

3.6 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**4. පිළිගැනීමේ නිලධාරී තනතුර**

4.1 වැටුප් පරිමාණයː- 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 30,350 - 11x330/ 10x380 - රු. 37,780/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 72,000/- පමණ වේ).

4.2 වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

4.3 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල/ දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයන් සඳහා සම්මාන ඇතුළුව සම්මාන සාමාර්ථ පහක් සහිතව විෂයන් හයකින් (06) එකවර සමත්වී තිබීම.

4.4 වෘත්තීය සුදුසුකම් : පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරනු ලබන පාඨමාලා කාලය වර්ෂයකට නොඅඩු ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම;

සහ

පිළිගත් ආයතනයක පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම සන්නිවේදනය කිරීමේ හැකියාව සහ වෙනත් විදේශීය භාෂාවන් කථා කිරීමේ හැකියාව විශේෂ සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

4.5 පළපුරුද්ද : පිළිගත් ආයතනයක පිළිගැනීමේ නිලධාරි තනතුරක/ පාරිභෝගික සේවා නිලධාරි තනතුරක අවම වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

ව්‍යතිරේකය :

වසර 10කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සහිත පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ A,B හා C යන වැටුප් කාණ්ඩවලට අයත් සාමාජික/සාමාජිකාවන්ට උක්ත 4.5 වැනි ඡේදයෙහි සඳහන් සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය නොවේ.

4.6 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක්, කථන පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

5. **පුහුණු කම්කරු (සිවිල්) තනතුර**

5.1 වැටුප් පරිමාණයː- 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520-9x270/10x300/6x330- රු. 32,930 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.63,000/- පමණ වේ.)

5.2 වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

5.3 අධ්‍යාපන සුදුසුකම් : සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම.

(*සටහන* - ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව NVQ III සහතිකයක් ලබා තිබේ නම්, ඉහත පරිදි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම අනිවාර්ය නොවේ.)

5.4 වෘත්තීය සුදුසුකම් : වෘත්තීය පුහුණු අධිකාරිය / ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය හෝ රජයේ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරන ලද වඩුකාර්මික, පෙදරේරු, ජලනළකරු, වැද්දුම්කරු, නළ පවිත්‍රකරු හෝ පින්තාරුකරු යන ක්ෂේත්‍රයකට අදාළ ව NVQ III සහතිකයක් ලබා තිබීම.

5.5 පළපුරුද්ද : රාජ්‍ය සේවයේ / පිළිගත් ආයතනයක ඉදිකිරීම් කාර්යයන් (සිවිල්) වලට අදාළව වසර 03 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

5.6 බඳවා ගැනීමේ ක්‍රමයː- ලිඛිත/ වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

6. සේවා නියමයන් හා කොන්දේසි :

(i) මෙම තනතුරු ස්ථිරය. මෙම තනතුරුවලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, අභ්‍යන්තර අයදුම්කරුවකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

7. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

8. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

9. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

10. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

හංස අබේරත්න,
වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්.

2023 ජූලි මස 26 වැනි දින,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

*ආදර්ශ අයදුම්පත්‍රය*

.......................... *තනතුර*

01. (*අ*) මුලකුරු සමග නම (සිංහලෙන්) :________________________________.

(*ආ*) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) :__________________________.

(*ඇ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- (Mr./Mrs. /Miss) :______________________.

02. ජාතික හැඳුනුම්පත් අංකය :- | | | | | | | | | | | | |

03. (*අ*) පෞද්ගලික ලිපිනය :______________________________.

දුරකථන අංකය :- | | | | | | | | | | |

(*ආ*) කාර්යාලයීය ලිපිනය :______________________________.

දුරකථන අංකය :- | | | | | | | | | | |

(*ඇ*) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය :

පෞද්ගලික :____________________. කාර්යාලයීය :____________________.

04. (*අ*) උපන් දිනය :________. (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු :________. මාස :________. දින :________.

05. විවාහක/ අවිවාහක බව :- (විවාහක/ අවිවාහක) :__________________________.

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ) :______________________.

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව :- (ඔව්/නැත) :__________________________.

08. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

09. වෘත්තීය සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

.....................................................................................................
.....................................................................................................

10. වෙනත් සුදුසුකම් :- (සහතික පිටපත් ඇමිණිය යුතු ය)

.....................................................................................................
.....................................................................................................

11. පළපුරුද්ද :- (සහතික පිටපත් ඇමිණිය යුතුය.)

| *ආයතනය* | *තනතුර* | *සේවා කාලය* |
|---|---|---|
| | | |
| | | |

12. වත්මන් රැකියාව පිළිබඳ විස්තර :
(අ) ආයතනයේ නම හා ලිපිනය :————.
(ආ) මුල් පත්වීමේ දිනය :————.
(ඇ) දැනට දරන තනතුර :————.
(ඈ) මාසික මූලික වැටුප :————.
(ඉ) දීමනා :————.
(ඊ) දළ වැටුප :————.

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න :————.

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද? (ඔව්/නැත)
එසේ නම් එම විස්තර සඳහන් කරන්න. :————.

ම විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

*දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය*
*(රාජ්‍ය ආයතනවල /පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)*

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ................................................ තනතුර දරන ................................ මයා/ මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර, ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙ හි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

07-407

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - (බණ්ඩ 2) III ශ්‍රේණියේ ක්‍රීඩා පුහුණුකරු නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2022

01. ඉහත තනතුරට අයත් නිලධාරීන් සඳහා අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් විභාගයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2023 නොවැම්බර්** මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. I. මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

II. විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනවා ඇත.

III. මෙම විභාගය සඳහා අයදුම්කළ හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පත්වීම් ලද ක්‍රීඩා පුහුණුකරු නිලධාරීන්ට පමණි.

03. විභාග ගාස්තු :-

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන් පසු වතාවක මුළු විභාගය සඳහා පෙනී සිටින්නේ නම් රුපියල් 500/- ක විභාග ගාස්තුවක් සහ මින් එක් විෂයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු.200/- ක විභාග ගාස්තුවක් ද විෂයයන් දෙකක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු. 400/- ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස, දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවිය යුතුයි.විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන බව ද විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරන බවද දන්වමි.

04. අයදුම්පත් :-

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුයි. එම ආදර්ශ අයදුම්පත අනුව, A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් පිළියෙල කළ යුතු අතර, ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් වන ලෙස ගෙන සකස් කළ යුතුය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල මාධ්‍ය අයදුම්පත්වල සිංහල මාධ්‍යට අමතරව ඉංග්‍රීසි මාධ්‍යයෙන්ද දෙමළ මාධ්‍ය අයදුම්පත්වල දෙමළ මාධ්‍යට අමතරව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද යෙදීම අවශ්‍යය. අයදුම්පත යතුරු ලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරෙන් ම සම්පූර්ණ කළ යුතුය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අපේක්ෂකයින් විසින් සිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/පීඨාධිපති/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2023 අගෝස්තු මස 28 වැනි දිනට** පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්" ආයතනික විභාග සංවිධාන ශාඛාව,ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ, වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත එවීමේ දී ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

05. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂය ක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියකියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

1. ජාතික හැඳුනුම්පත,
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
3. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර ගනු නොලැබේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත මාර්ගගත ක්‍රමයට පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා/හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළකරනු ඇත. ප්‍රවේශ පත්‍රය බාගත කළ නොහැකි නම් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සටහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත්වනු ඇත.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණි. ඒ අතරින් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම විභාගය කොළඹදී පමණක් පවත්වනු ලැබේ.

09. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

10. *විභාග පරිපාටිය* - ඉහත තනතුරට අදාළ විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* | *අවම සමත් ලකුණ* |
|---|---|---|---|---|
| 01. කාර්යාල ක්‍රම | 01 | 100 | පැය 2 | 40 |
| 02. මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | 02 | 100 | පැය 2 | 40 |
| 03. විෂය දැනුම | 03 | 100 | පැය 1½ | 40 |

(01) කාර්යාල ක්‍රම (ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි)

රජයේ කාර්යාලවල භාවිතවන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම :

- කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්ම
- කාර්යාල ක්‍රම පිළිබඳ මූලධර්මවල වැදගත්කම
- කාර්යාල ක්‍රම භාවිතා කිරීම පිළිබඳ අවබෝධය
- ලිපිගොනුකරණය

(02) මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම (ව්‍යුහගත රචනා ප්‍රශ්න පත්‍රයකි)

රජයේ කාර්යාලවල භාවිතවන මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම :

මුදල් රෙගුලාසි සංග්‍රහයේ පරිච්ඡේද I, II, III, IV, V යටතේ ඒකාබද්ධ අරමුදල, වාර්ෂික වියදම් ඇස්තමේන්තු, ආදායම් ඇස්තමේන්තු අනුව වියදම් කිරීමට අධිකාරි බලය හා වියදම් පාලනය පිළිබඳ දැනුම, මුදල් පාලනය හා ගිණුම් ලැබීම් හා ගෙවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

(03) විෂය දැනුම :

- ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරග
- ක්‍රීඩා පුහුණු සැලසුම්
- පාසල් ක්‍රීඩා චක්‍රලේඛ
- ක්‍රීඩා පිටි හා උපකරණ
- ප්‍රථමාධාර
- ක්‍රීඩා නීති රීති හා තරග සටහන්
- ක්‍රීඩා ආචාරධර්ම
- තහනම් ද්‍රව්‍ය හා උත්තේජක
- ක්‍රීඩා පෝෂණය

(උක්ත විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වන මූලික දැනුම)

11. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. මෙම විභාග නිවේදනය මඟින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2023 අප්‍රේල් මස 21 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - (ඛණ්ඩ - 2)
III ශ්‍රේණියේ ක්‍රීඩා පුහුණුකරු නිලධාරීන් සඳහා වන
පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2022
1st Efficiency Bar Examination for the Sports Trainers of Grade III Management Assistant - Non - Technical Service (Segment 2) in the Ministry of Education - 2022

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐

☐
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

අදාළ අංකය කොටුව තුළ ලියන්න

සිංහල - 2
දෙමළ - 3

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————. (උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————. (උදා : GUNAWARDHANA H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. සේවා ස්ථානය හා ලිපිනය :
2.1 සේවා ස්ථානයේ නම :————.
2.2 රාජකාරි ලිපිනය :————.
2.3 රාජකාරි ලිපිනයේ තැපැල් නගරය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ)

03. ස්ත්‍රී / පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. දැනට දරන තනතුර (පත්වීම් ලිපියේ සඳහන් පරිදි) :————.
6.1 පත්වීම් ලිපියේ අංකය :————.
6.2 පත්වීම් දිනය :————.

07. ඔබ ඉදිරිපත් වන කඩඉම් විභාගයට අදාළ විෂයය/විෂයයන් :
(*ගැසට් නිවේදනයේ 10 වන ඡේදය බලන්න.*)

| *අනු. අංකය* | *විෂයය* | *විෂයය අංකය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |

08. විභාග ගාස්තුව (අදාළ නම් පමණි.)
I. ගෙවන ලද මුදල : රු. ————————————.
II. ගෙවන ලද තැපැල් කාර්යාලය : ————————————.
III. ලදුපත් අංකය : ————————————.

*ලදුපතෙ හි එක් දාරයකින් මෙහි අලවන්න. (අදාළ නම් පමණි.)*
*(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

09. *අයදුම්කරුගේ ප්‍රකාශය* :

ඉහත විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරන අතර, මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බව ද ප්‍රකාශ කරමි. නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත මෙහි අලවා ඇති බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.

දිනය :————.

*සටහන* - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

10. *අත්සන සහතික කිරීම* :

මගේ කාර්යාලයේ/විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ/ගුරු මධ්‍යස්ථානයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................................... මයා/මිය/මෙනවිය .................................... දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද, නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බව ද/ නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.
(ආසන්නතම මාණ්ඩලික නිලධාරි /විදුහල්පති)

නම : ................................................................................
පදවි නාමය : ................................................................................
ලිපිනය : ................................................................................
දිනය : ................................................................................

11. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් ඇති බවත්,
3. නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් බව/ නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව සහතික කරමි.

________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ/
පීඨාධිපතිගේ අත්සන හා නිල මුද්‍රාව.

නම : ..........................................................................
පදවි නාමය : ..........................................................................
ලිපිනය : ..........................................................................
දිනය : ..........................................................................
(අදාළ නොවන වචන කපා හරින්න.)

07-405

---

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරී - බණ්ඩ I නිලධර ගණයේ භාෂා පරිවර්තක ( II ශ්‍රේණිය) තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන විවෘත තරග විභාගය - 2023
Competitive Examination for the filling of vacancies in the Posts of Translator (Grade II) in the Legal Draftsman's Department - 2023

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක II ශ්‍රේණියේ ඉංග්‍රීසි/සිංහල තනතුරු 08ක සහ ඉංග්‍රීසි/දෙමළ තනතුරු 08ක පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2023 නොවැම්බර් මස කොළඹ දී පැවැත් වේ. නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමතය මත මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීම සිදු කරනු ලැබිය හැකිය.

(අ.) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2023 අගෝස්තු මස 25** වැනි දින වේ.

**සටහන** : අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

01.සේවයේ නියුක්තකරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතුය.

(iii) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසි වලට ද නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරීන් බණ්ඩ 1 නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදු කර ඇති හා සිදු කරනු ලබන්නා වූ සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

(iv) ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

02. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට අංක 06/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව (MN 6 -2016) රු.36,585-10x660-11x755-15x930- රු. 65,440/- ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

03. සුදුසුකම් :

3.1 අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්:

i. (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා ගෙන තිබීම;

හෝ

(ආ) නීතිඥ විභාගය සමත් වී නීතිඥවරයකු වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම;

සමග

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමර්ථ්‍යයක් හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා ඊට උසස් සුදුසුකමක් (පත්වීම් බලධාරියා විසින් පිළිගනු ලබන) සමග අයදුම් කරන තනතුරට අදාළව සිංහල / දෙමළ භාෂාවට සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම.

3.2 කායික සුදුසුකම්:

සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

3.3. වෙනත් සුදුසුකම්:

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, එනම් **2023 අගෝස්තු 25 දිනට** තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. අයදුම්කරුවන් ශ්‍රී ලංකා නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරුවකු වී නොතිබිය යුතුය.

04. වයස් සීමාව:

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි වීම. (රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

05. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ දී ප්‍රශ්නපත්‍ර දෙකම සමත් අයදුම්කරුවන් අතරින් ප්‍රශ්න පත්‍ර දෙක සඳහා ලබාගත් ලකුණුවල එකතුව අනුව කුසලතා අනුපිළිවෙලට බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

06. විෂයය නිර්දේශය :

6.1 ලිඛිත විභාගය:

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/සිංහල) සහ භාෂා පරිවර්තක (ඉංග්‍රීසි/දෙමළ) තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

(01) පරිවර්තන නිපුණතාව - ලකුණු 100 යි - කාලය පැය 03

(02) භාෂා නිපුණතාව - ලකුණු 100 යි - කාලය පැය 03

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *සාමාර්ථය සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රතිශතය* |
|---|---|---|
| 1. පරිවර්තන නිපුණතාව | i. ඉංග්‍රීසි භාෂාවෙන් ඇති පාර්ලිමේන්තු පනතක කොටසක් සිංහල/දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.<br>ii. ඉංග්‍රීසි භාෂාවෙන් වූ පනතක කොටසක් එහි සදොස් සිංහල/දෙමළ පර්වර්තනයන් ද සමග සසඳා සිංහල/දෙමළ පරිවර්තනය නිවැරදි ලෙස ප්‍රතිශෝධනය කිරීම. | 40% |
| 2. භාෂා නිපුණතාව<br>I කොටස<br>සිංහල/දෙමළ භාෂා දැනීම | සාරාංශය, අක්ෂර වින්‍යාසය හා වචනවල අර්ථ නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම. | 40% |
| II කොටස<br>ඉංග්‍රීසි දැනීම | සාරාංශය, අක්ෂර වින්‍යාසය හා වචනවල අර්ථ නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම. | |
| අදාළ රාජ්‍ය භාෂා දෙකෙන් (සිංහල/ දෙමළ) එකක් හා ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රවලට අපේක්ෂකයන් පෙනී සිටිය යුතුය. | | |

6.2 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**
සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම. (ලකුණු ලබාදෙනු නොලැබේ)

07. ඉල්ලුම් කිරීමේ පිළිවෙළ

ආදර්ශ අයදුම්පත :

7.1 මෙම නිවේදනය අවසානයේ පළකර ඇති ආදර්ශ අයදුම්පත ආකාරයට අයදුම්කරුවන් විසින් තම අයදුම්පත විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ම පිළියෙළ කළ යුතු අතර, එය තමන්ගේ ම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ සෑම වගන්තියක්ම උපදෙස් දී ඇති පරිදිම අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු අතර, තමන් වෙනුවෙන් අදාළ නොවන වගන්ති වෙතොත් ඒවා " අදාළ නොවේ" යනුවෙන් සටහන් කළ යුතුය. අයදුම්පතේ හිස් තීරු තැබීමෙන් එය ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇති බව තරයේ ම සිහි තබා ගත යුතුය. අයදුම්පත සෙ.මී. 21x29.7 ප්‍රමාණයේ A4 කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් සකස් කළ යුතු අතර,

(අ.) අංක 1 සිට 7 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද

(ආ.) අංක 8 සිට 13 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද

(ඇ.) අංක 14 සිට 16 (I) ශීර්ෂ තෙවන පිටුවට සහ ඉතිරිය හතරවන පිටුවට ඇතුළත් වන සේ අයදුම්පත පිළියෙල කළ යුතු අතර නියමිත ලෙස සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.2 තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත මෙම විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප වන බවත් වැඩිදුරටත් දන්වමි.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

7.3 පිළියෙළ කරන ලද අයදුම්පත් **2023 අගෝස්තු මස 25** දිනට හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ "නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන විවෘත තරග විභාගය - 2023" ලෙස පැහැදිලිව සටහන් කළ යුතුය. තව ද විභාගයේ නම, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය.

7.4 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් ලද බව නොදන්වන අතර අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවා ඇති අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*විභාග ගාස්තු :*

7.5 විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට හෝ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබාගන්නා ලදුපතෙහි දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

7.6 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

08. **විභාග ප්‍රවේශ පත්‍ර**

8.1 නිවේදනයෙ හි සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත.

8.2 නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණු අපේක්ෂකයකු වේ නම් ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එහි දී අයදුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා ඉල්ලුම් කරන ලද විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් ඉහත විස්තර සමඟ, ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායී වේ. එහිදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා ඔබ ළඟ තබා ගත් සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙ හි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම වඩාත් ඵලදායී වනු ඇත.

8.3 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

විභාග ප්‍රවේශ පත්‍රය සහතික කරගැනීම :

8.4 විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ අත්සන තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා ලවා ද සහතික කරවා ගත යුතුය. එසේ නොවන අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු/ විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

විභාගයට ඇතුළත්කර ගැනීම :

8.5 නියමිත කර ඇති විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතුය, විභාගයට පෙනී සිටින පළමු දිනයේ දීම, විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ නොකරන අපේක්ෂකයකුට විභාගයට ඇතුළත් වීමට ඉඩ නොලැබෙනු ඇත.

8.6 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

*සැලකිය යුතුය :*

(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ) සම්මුඛ පරීක්ෂණයේ දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාව:

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(I) ජාතික හැඳුනුම්පත
(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(III) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණ කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. සාවද්‍ය තොරතුරු සැපයීම :

10.1 යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

10.2 අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

11. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ අයිතිය නීති කෙටුම්පත් සම්පාදක සතුය.

12. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

13. මෙහි සඳහන් පුරප්පාඩු අතුරින් කොටසක් හෝ සියල්ල නොපුරවා තැබීමේ අයිතිය නීති කෙටුම්පත් සම්පාදක සතුවේ.

දිල්රුක්ෂි සමරවීර,
නීති කෙටුම්පත් සම්පාදක.

2023 ජූලි මස 28 වැනි දින,
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

ආදර්ශ අයදුම්පත

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වන විවෘත තරග විභාගය - 2023**

Competitive Examination for Filling of Vacancies in the Posts of Translator in the Legal Draftsman's Department - 2023

01. ඉල්ලුම්කරන තනතුර
ඉංග්‍රීසි/සිංහල භාෂා පරිවර්තක - 1
ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිවර්තක - 2 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐

සිංහල - 2 දෙමළ - 3 ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

03. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
I. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
(උදා : GUNAWARDHANA, M.G.B.S.K.)
II. සිංහලෙන්/දෙමළෙන් :————.

04. මුලකුරුවලින් හැඳින්වෙන නම :
I. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
II. සිංහලෙන්/දෙමළෙන් :————.

05. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය :
I. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
II. සිංහලෙන්/දෙමළෙන් :————.

06. I. ස්ථිර ලිපිනය :————.
II. එය අයත් දිස්ත්‍රික්කය :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය ☐
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. ජංගම දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

09. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද : ☐
ඔව් - 1
නැත - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

11. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

12. 2023 අගෝස්තු 25 දිනට වයස :

අවුරුදු :————. මාස :————. දින :————.

13. I. වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් :————.

II. දෙවන භාෂාව පිළිබඳ ලබා ඇති ඉහළම සුදුසුකම :————.

III. පළමු භාෂාව පිළිබඳ ලබා ඇති ඉහළම සුදුසුකම :————.
(අ.පො.ස. (සා.පෙළ/උ.පෙළ) විභාගවලින් වන්නේ නම් වර්ෂය හා ඔබ ලැබූ ශ්‍රේණිය (සම්මාන/විශිෂ්ට) සඳහන් කළ යුතු වේ.)

IV. (අ) උපාධි සුදුසුකම් ඃ

| උපාධිය | විෂයයන් | සාමාර්ථය | වර්ෂය | විශ්වවිද්‍යාලය |
|---|---|---|---|---|
| | | | | |

(ආ) පශ්චාත් උපාධි සුදුසුකම් ඃ

| පශ්චාත් උපාධිය | උපාධිය පිරිනමන ලද වර්ෂය | විශ්වවිද්‍යාලය |
|---|---|---|
| | | |

V. නීතිඥ වෘත්තියේ ලද පළපුරුද්ද ඃ
(සේවා සහතිකයක් ඇමිණිය යුතුය.)

14. I. අධිකරණයක් ඉදිරියේ ඔබ කෙදිනක හෝ කිසියම් වරදකට වරදකරු වී ඇද්ද ? ඔව්/ නැත

ඔව් නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න :————.

II. විභාග ගාස්තු :————.
ලදුපත් අංකය :————.
මුදල් ගෙවූ දිනය :————.
මුදල් ගෙවූ බැංකුව සහ ශාඛාව :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

15. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කර සිටිමි/දිවුරුම් දෙමි.

(ආ) මවිසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බැව් හෝ වැරදි බැව් මා තෝරා ගනු ලැබීමට පෙර ඔප්පු වුවහොත්, මා නුසුදුස්සකු බවට තීරණය කරනු ලැබීමට හා පත්වීම ලැබීමෙන් පසු අසත්‍ය බැව් හෝ වැරදි බැව් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොමැති ව අදාළ ක්‍රියාමාර්ගවලට යටත්ව, සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන රීතිවලට මම යටත් වන බව ද විභාගයට අදාළ ගාස්තුව ගෙවා ලබා ගත් ලදුපත මෙයට අලවා ඇති බව ද ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

16. I. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන...........................................(සම්පූර්ණ නම) මහතා/මහත්මිය/මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය 2023......................... මස................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව තබන්න)

II. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය. (රාජ්‍ය ආයතනයක සේවයේ නියුතු නම් පමණි.)

ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය ඉහතින් සපයා ඇති විස්තර මා පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි ය./නොහැකි ය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය :————.

දිනය :————.
(නිල මුද්‍රාව තබන්න)

07-406

---

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න**

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2023 වර්ෂය**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණකාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර

ක්‍රියාකරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 23,000 NVQ සහතිකපත් පාඨමාලාව රු. 36,000

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**
**පොත් බැඳීම - Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව මේ තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 36,000
NVQ පාඨමාලාව : රු. 65,000

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 30,000

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 30,000

---

**පරිගණක දෘඪාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඪාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙදා පැන නගින දෘඪාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.21,000

---

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 27,000

---

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවකි.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 31,000

---

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

---

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂය මාලාව සකස්කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 61,000

---

**වෙබ් අඩවි නිර්මාණය - Certificate Course in Web Design**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණකරණය පිළිබඳ නවීන තාක්‍ෂණයට අනුකූලව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව නවකයන්ට ද මාධ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන සියලු දෙනාටම ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 05 මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 21,000

**ඩිජිටල් පෙර මුද්‍රණය - Certificate Course in Digital Pre Press**

මෙම පාඨමාලාව තුළින් පෙර මුද්‍රණ තාක්ෂණයට අදාළ මෘදුකාංග සහ අනෙකුත් මුද්‍රණ තාක්ෂණයට අදාළ ඩිජිටල් ක්‍රියාවලියන් පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : වසර 01යි    මාධ්‍ය : සිංහල    පාඨමාලා ගාස්තුව : රු. 26,000

**පිරිවැය හා ඇස්තමේන්තුකරණය - Certificate Course in Costing & Estimating**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයේ පිරිවැයකරණය සමග ඇස්තමේන්තුකරණය පිළිබඳ පූර්ණ දැනුමක් සහ අවබෝධයක් ලබාදේ. මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද එම ක්ෂේත්‍රයට ඇතුළත් වන නවකයන්ට ද ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : වසර 01 යි    මාධ්‍ය : සිංහල    පාඨමාලා ගාස්තුව : රු. 26,000

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස්කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

**පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**

**දුරකථන : 011 2686162, 011 2679791, 071 9716655, 077 7706995**
**ෆැක්ස් : 011 2686162**
**ඊ-මේල් : sliopdir@sltnet.lk**
**වෙබ් අඩවිය : www.sliop.edu.lk**

**ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.**
**දුරකථන අංක : 066 2222172, 071 0554298.**

07-000

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.